මේ වනවිට අපි කොවිඩ්-19 තුන්වන රැල්ල මර්දනයට උත්සාහ දරමින් සිටිමු. මෙම මොහොතේදී සෞඛ්‍ය නිර්දේශයන් පිළිබඳව සමාජය දැනුවත් කිරීම මෙන්ම, කොවිඩ්-19 ආසාදිතයන් හා ආශ්‍රිතයන් සම්බන්ධයෙන් කොන් කිරීමක් නැතිනම් ගර්හාවක් සමාජය තුළ ඇතිවීම වැළැක්වීමද මාධ්‍ය වගකීමක් වේ.
කෙසේ නමුත්, "කොරෝනා කත", "කොරෝනා සිවිල් ආරක්ෂකයා" වැනි යෙදුම් ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයන් සෘණාත්මකව ලේබල්ගත කිරීම ඔස්සේ මෙම මාධ්‍ය මේ මොහොතේ ඉටුකරමින් හිඳින්නේ එම සමාජ වගකීමද? එසේත් නැතිනම් මේ ආචාර ධාර්මික නොවන මාධ්‍ය හැසිරීමක් නොවන්නේද? මෙවැනි යෙදුම් ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයන් හා ආශ්‍රිතයන් පිළිබඳව කොන් කිරීමේ, ගර්හාත්මක ආකල්පයක් සමාජය තුළ ඇතිවීමට උඩගෙඩි දීම කොවිඩ්-19 මර්දන කටයුතු සඳහාද බාධාවක් නොවන්නේද?
#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Divaina